කැගල්ල ප්‍රාදේශීය සභාව - 2022
----------------------------------

# 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

කැගල්ල ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කැගල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------------- | -------------- |
| (අ) | 2019 වර්ෂය සඳහා හිඟහිටි මුද්දර ගාස්තු රු. 297,000 ක් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව. | ගිණුම නිවැරදි කළ යුතු වේ. |
| (ආ) | රු.1,214,289 ක් වූ වයිබ්‍රේටර් රෝල, ප්ලේට් කම්පැක්ටරය, තාර බොයිලේරුව හා විදුලි ජනක යන්ත්‍රය, යන්ත්‍ර උපකරණ යටතේ ගිණුම්ගත නොකර, මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | භෞතිකව නොපැවැතුණු, රු.79,900ක් වූ තණකොළ කපන යන්ත්‍රයක් ස්ථාවර වත්කමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සිදුකරන මූලික විමර්ශනයෙන් පසු ඉදිරි කටයුතු සිදු කරන බව. | -එම- |

### 1.6.2 නොසැසඳුණු පාලන ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------- | ------------------------------ | ------------- |
| මූල්‍ය ප්‍රකාශන අනුව, විවිධ වත්කම් හා ආදායම් ගිණුම් 19 ක ශේෂ, ඒ ඒ ගිණුම් විෂයන්හි උපයෝගී ලේඛන හා සැසඳීමේදී රු.19,101,869ක වෙනසක් පැවතුණි. | එම වෙනස්කම් සැසඳීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල සංඛ්‍යා, උපයෝගී ලේඛන සමග සැසඳිය හැකිවිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 42,347,642 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 36,210,272 ක් විය.

### 2.2. ආදායම් පරිපාලනය

#### 2.2.1. ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු | රු | රු | රු | රු | රු | රු | රු |
| වරිපනම් හා බදු | 3,237,700 | 3,368,627 | 2,148,977 | 2,345,531 | 3,200,200 | 3,262,965 | 1,858,921 | 2,443,431 |
| කුලී | 4,134,400 | 3,904,325 | 3,721,175 | 280,745 | 3,767,000 | 5,285,700 | 3,397,100 | 547,041 |
| බලපත්‍ර ගාස්තු | 980,100 | 882,246 | 882,246 | - | 600,000 | 826,955 | 649,500 | - |
| වෙනත් ආදායම් | 3,996,500 | 6,160,291 | 4,256,085 | 1,904,205 | 3,144,100 | 4,025,393 | 2,264,920 | 190,110 |
| | 12,348,700 | 14,315,489 | 11,008,483 | 4,530,481 | 10,711,300 | 13,401,013 | 8,170,441 | 3,180,582 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

| නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම්, අක්කර බදු හා කඩ කුලී යන ආදායම් විෂයයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට රු.2,430,216ක් අයවිය යුතුව තිබුණි. එම වටිනාකම තුළ වර්ෂ 01ත් වර්ෂ 05ත් අතර රු.1,427,398ක ශේෂයක් ද, වර්ෂ 05කට වඩා පැරණි රු.706,522ක ශේෂයක් ද පැවැතුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව හා අයකර ගත නොහැකි ශේෂ කපාහැරීම සිදු කරන බව. | හිඟ හිටි ආදායම් නොපමාව අයකර ගත යුතු වේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉඩම් ගොඩනැගිලි 06 ක්, අක්කර 1 ½ ක ඉඩමක්, කාර්යාල ගබඩා ද්‍රව්‍ය හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 1246 ක් තක්සේරු කර මිල හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ගිණුම්ගත කරන බව. | වත්කම් නිසි වටිනාකමට ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | 2015 වර්ෂයේ දී ලද බැකෝ යන්ත්‍රයට 2016 වර්ෂයේ සිට මේ දක්වා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. | ලියාපදිංචි සහතිකය නිවැරදි කර දෙන ලෙස මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇති බව. | වත්කම්වල අයිතිය නිරවුල් විය යුතු වේ. |
| (ඇ) | කර්මාන්ත ණයගැතියන්ගෙන් රු.33,791,348 ක් අයවිය යුතුව පැවති අතර ණයහිමියන් වෙනුවෙන් රු.26,543,620ක් ගෙවීමට තිබුණි. | එකඟ වේ. | ශේෂ නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථගාල් කිරීමට ස්ථාන 55ක් හඳුනාගෙන තිබුණද, එම ස්ථාන ගාස්තු අයකළ හැකිවන පරිදි සකස්කර නොතිබුණි. මේ නිසා, වාහනවලින් ගාස්තු අය කිරීම වෙනුවට නැවතුම් ගාස්තු ලෙස සභාවට ලැබෙන මුදල වර්ෂයේ ආදායම ලෙස සලකා ගිණුම් ගතකර තිබුණි. | ත්‍රීරෝද රථ නැවතුම්පොළවල අයිතිය මාර්ග සංවර්ධන අධිකාරිය සතුවේ. එම අධිකාරිය සමඟ එකඟතාවකට පැමිණ ස්ථාන සකස් කර දී මුදල් අයකර ගන්නා බව. | ලැබිය යුතු සියලු ආදායම් අය කළයුතු වේ. |
| (ආ) | 1975 අංක 01 දරන වත්කම් බැරකම් ප්‍රකාශ කිරීමේ පනත ප්‍රකාර සභිකවරුන් 22 දෙනෙකු විසින් පළමුව ලබාදිය යුතු එම ප්‍රකාශ ලබා දී නොතිබුණු අතර සභිකයින් 27 දෙනෙකු විසින් 2019 වර්ෂයේ සිට 2022 දක්වා එම වාර්ෂික ප්‍රකාශ ඉදිරිපත්කර නොතිබුණි. | ලබාදුන් වත්කම් බැරකම් ප්‍රකාශ පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී ලද රු. 21,095,000 ක් වූ වාහන 03ක් සභාවට පවරාගෙන නොතිබුණි. | වාහන 02ක් පවරා ගැනීමට කටයුතු කළ ද, බැකෝ යන්ත්‍රයේ චැසි අංකයේ වූ වෙනසක් නිසා පවරා ගැනීම ප්‍රමාද වී ඇති බව. | සභාව සතු අයිතිය නිරවුල් විය යුතු වේ. |
| (ආ) | සභාව සතු රු.971,877ක් වූ වාහන 2ක් වසර 10ත් 12ත් අතර කාලයක සිට අක්‍රියව පවතී. | අනුමැතිය ලද පසු ඉන් එක් වාහනයක් අපහරණය කරන බව. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |
| (ඇ) | දිවාසුරැකුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීමට රු.1,694,935ක් වැය කළ ද, ඊට පාලිකාවක් බඳවාගත නොහැකි වීමෙන් 2019 ඔක්තෝබර් සිට වසා දමා තිබුණි. එමෙන්ම, එම මධ්‍යස්ථානයට නිකුත් කළ රු.140,650ක් වූ භාණ්ඩ ඒකක 19ක් ඉන්වෙන්ට්‍රිගත කර, නිලධාරියෙකුට භාර දී නොතිබුණි. | අවශ්‍ය කටයුතු ඉටු කරන තෙක් එම ගොඩනැඟිල්ල මත්ද්‍රව්‍ය නිවාරණ උපදේශන මධ්‍යස්ථානයක් හා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් ලෙස භාවිතා කරනු ලැබේ. අදාළ භාණ්ඩ පොදු ගබඩාවේ ආරක්ෂිතව තබා ඇති බව. | අපේක්ෂිත අරමුණු ඉටු විය යුතු වේ. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අංක 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට පටහැනිව, 2021 හා 2022 වර්ෂ තුළ ඉටු කළ මුළු කොන්ත්‍රාත් සංඛ්‍යාවෙන් පිළිවෙලින් සියයට 78ක් හා සියයට 68ක් එකම කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනමා තිබුණි. | කොන්ත්‍රාත් සමිති ඉදිරිපත් නොවීම නිසා මහා සභාවේ එකඟතාව මත සිදු කළ බව. | අදාළ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාන මාරුවී ගිය, විශ්‍රාම ගිය, සේවය හැරගිය නිලධාරීන් 4 දෙනෙකුගෙන් අයවිය යුතු රු.276,984 ක ණය ශේෂය, වසර 4 සිට වසර 6 දක්වා කාලයක් පැරණි විය. | හිඟහිටි ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරමින් පවතින බව. | හිඟහිටි ශේෂ අයකර ගත යුතු වේ. |